# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,127 - 2019 ජුනි මස 07 වැනි සිකුරාදා - 2019.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු 1 .... ... ... | 1106 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1130 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජුනි මස 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජුනි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1105 - B 81530— 5,403 (2019/05)

## තනතුරු - ඇබෑර්තු

### තිහගොඩ ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ (පළාත් පාලන) පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

| අනු. අංකය | තනතුරු නාමය | සේවා ශ්‍රේණිය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | බඳවා ගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් හා අමතර සුදුසුකම්/පළපුරුද්ද |
|---|---|---|---|---|---|
| 01 | විදුලි කාර්මික | III ශ්‍රේණිය ප්‍රාථමික අර්ධ ශිල්පීය | 01 | රා.ප.ච. 03/2016 අනුව PL - 02 - 2016 රු. 25,250 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 රු. 38,450 | අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හය (06) ක් සමත් වී තිබිය යුතුය.<br><br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම.<br><br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

I. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට උපරිම වයස් සීමාව අදළ නොවන අතර ඔවුන් අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් තම අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

II. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

III. අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 කාලයක් මාතර දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය.

IV. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් සහ තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

VI. රජයේ සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

VII. අයදුම්කරුවන් බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එතෙකුදු වුවත් තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.

II. බඳවා ගනු ලබන්නන් වැන්දඹු අනත්දරු වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

III. බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

IV. බඳවා ගනු ලබන්නන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුයි

V. එක් එක් තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් සඳහා 2016.01.01 වැනි දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි II වැනි උපලේඛනය අනුව වේ. එම වැටුප් පරිමාණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනුයේ 2020.01.01 දින සිටය.

VI. තිහගොඩ ප්‍රාදේශීය සභාවේ දැනට සේවයේ නියුතු තාවකාලික /අනියම්/ආදේශක/කොන්ත්‍රාත් ලියාපදිංචි පදනම මත සේවය කරනු ලබන සේවකයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

VII. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට ද දකුණු පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද තිහගොඩ ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

VIII. තනතුරු සඳහා බඳවා ගනු ලබන සේවකයින් දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2013.04.16 වැනි දින අනුමත කරන ලද 239 දරන දකුණු පළාත් රාජ්‍ය සේවයේ ආයතනගත කණිෂ්ඨ සේවක සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අදළ බඳවා ගැනීමේ පටිපාටියේ නියෝගවලට සහ එය වරින් වර නිකුත් කරන රෙගුලාසි සහ සංශෝධනයන්ට අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

04. *අයදුම්කළ යුතු ආකාරය* :

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2019.06.21 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "සභාපති, තිහගොඩ ප්‍රාදේශීය සභාව, තිහගොඩ" යන ලිපිනයට පහත සඳහන් ලියවිලිවල සහතික කරන ලද පිටපත් සමග අමුණා ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. දක්වා ඇති උපදෙස් වලට පටහැනි, අසම්පූර්ණ, අපැහැදිලි මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (දනටමත් රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.)

*අයදුම්පත සමග එවිය යුතු ලියවිලි* :

01. උප්පැන්න සහතිකය,
02. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්,
03. අධ්‍යාපන සහතික/පාසල් හැරයාමේ සහතිකය,
04. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය සනාථ කිරීමේ සහතිකය (මාස 06ක් තුළදී ලබාගත්),
05. සාපරාධී වරදක් සම්බන්ධයෙන් මෙතෙක් උසාවියකින් වරදකරුවකු කර නැති බව හා එවැනි වරදක් සම්බන්ධයෙන් දැනට පරීක්ෂණයට භාජනය වූ අයෙකු නොවන බවට තහවුරු කරන බවට පොලිස් සහතිකය,
06. වෘත්තීය හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික (තිබේ නම් පමණක්),
07. මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක්.

05. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය තිහගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

මෙම නිවේදනයේ දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සළසා නොමැති සියලුම කරුණු පිළිබඳ අවසන් තීරණය තිහගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති සතු වන්නේ ය.

ලක්ෂ්මන් නිර්මාල් සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
තිහගොඩ.

2019 මැයි මස 20 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***තිහගොඩ ප්‍රාදේශීය සභාව***

*........................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (i) මුලකුරු සමග නම :

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම :

02. ස්ථිර ලිපිනය :

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :

04. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :

05. උපන් දිනය ඃ අවුරුද්ද : මාසය : දිනය :

06. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස ඃ (2019/06/21 දිනට)

අවුරුදු : මාස : දින :

07. ස්ත්‍රී පුරුෂ භාවය :

08. ජාතික හැඳුනුම්පත් අංකය :

09. දුරකථන අංකය :

10. විවාහක/අවිවාහක බව :

11. ඔබ ශ්‍රී ලාංකිකයෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? යන වග :

12. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාගය පිළිබඳ විස්තර) :

12.1 අවසන් වරට සමත් වූ පන්තිය :

12.2 අ.පො.ස. (සා. පෙළ) විභාගය :

(i) වර්ෂය : මාසය :

(ii) විභාග අංකය :

(iii) ප්‍රතිඵල :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

12.3 අ.පො.ස. (උ.පෙළ) විභාගය ඃ

(i) වර්ෂය : මාසය :

(ii) විභාග අංකය :

(iii) ප්‍රතිඵල :

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

13. වෘත්තීය හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය.) :——————————

14. ඔබ දැනටමත් රජයේ රැකියාවක නියුතු නම් -
    i. දැනට දරන තනතුර :——————————
    ii. සේවය කරන ස්ථානය :——————————
    iii. පත්වීමේ දිනය හා ස්වභාවය :——————————

15. ඔබ කවරදාක හෝ සාපරාධී වරදක් හෝ චෝදනාවක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවෙකු කර ඇත්ද?...............
    එසේ නම් තොරතුරු :——————————

16. අයදුම්කරුගේ සහතිකය

    මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනුම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත්වීම් ලැබීමෙන් පසු එවැනි කරුණක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

06-53

---

## පන්විල ප්‍රාදේශීය සභාව

### මධ්‍යම පළාතේ රාජ්‍ය සේවයේ පන්විල ප්‍රාදේශීය සභාව සඳහා රියැදුරු/ඖෂධ සංයෝජක තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පන්විල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පන්විල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් 2019.06.28 දිනට පෙර ''ලේකම්, පන්විල ප්‍රාදේශීය සභාව පන්විල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ පන්විල ප්‍රාදේශීය සභාවේ (ඉල්ලුම් කරන තනතුර) සඳහා අයදුම්පත්‍රය යනුවෙන් සඳහන් කල යුතුය. පන්විල ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර සේවකයන්ට හා පන්විල ප්‍රාදේශීය සභා සීමාව තුළ පදිංචිකරුවන් වෙත ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* |
|---|---|
| රියැදුරු III ශ්‍රේණිය | 02 |
| ඖෂධ සංයෝජක III ශ්‍රේණිය | 01 |

රියැදුරු තනතුරට බඳවා ගැනීම සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

01. බඳවා ගැනීමේ ක්‍රමය :

    1.1 බඳවා ගන්නා අනුපාතය

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |

1.2 විවෘත බඳවා ගැනීම

1.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

1.2.2 සුදුසුකම් :

1.2.2.1 *අධ්‍යාපන සුදුසුකම් :*
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2ක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.

1.2.2.2 *වෘත්තීය සුදුසුකම් :*

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල එක් එක් තනතුරු සඳහා අදාළ වන බාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.
B-1,B,C-1,C,CE,D-1,D,G-1,G,J

1.2.2.3 *පළපුරුද්ද :*

මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 3ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කල යුතුය.)

1.2.2.4 *කායික සුදුසුකම්:*

(i) සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ii) අවම උස අඩි 05 අඟල් 2 1/2ක් විය යුතුය.

1.2.3 *වයස :*

1.2.3.1 අවම සීමාව : අවුරුදු 18 යි.

1.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45 යි

1.2.4 *බඳවා ගැනීමේ ක්‍රමය :*

බඳවා ගැනීමේ ක්‍රමය ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහලම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගේ වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගේ ඉහලම ලකුණු ලැබුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

1.2.4.1 ලිඛිත පරීක්ෂණය :

1.2.4.1.2 විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | මුළු ලකුණු සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 20% |

1.2.4.1.3. මෙම පරීක්ෂණය අදාළ පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලැබේ. තරග විභාගයට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ. සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබා ගත යුතුවේ.

1.2.4.1.4 විභාගය සඳහා විෂයය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| 1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධව බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධව බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |

1.2.4.2 වෘත්තීය පරීක්ෂණ :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශිර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු ඉහලම ලකුණු ලැබුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |
| 2. මහාමාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

1.3 සීමිත බඳවා ගැනීම :

දැනටමත් අදාළ පළාත් පාලන ආයතනයේ තනතුරක ස්ථිර කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති සේවකයන් සඳහා අදාළ වේ.

1.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

1.3.2 සුදුසුකම් :

1.3.2.1 *අධ්‍යාපන සුදුසුකම්* :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2ක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම. මින් විෂයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.

1.3.2.2 *වෘත්තීය සුදුසුකම්* :

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල එක් එක් තනතුරු සඳහා අදාළ වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. ඊට අමතරව යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් 4 වැනි මට්ටම ( NVQ-4) පුහුණු සහතිකය.

1.3.2.3 *පළපුරුද්ද* :

මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 3ක පළපුරුද්ද ලබා තිබීම. (පලපුරුද්ද සහතික මගින් සනාථ කල යුතුය.

1.3.2.4 *කායික සුදුසුකම් :*

(i) සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ii) අවම උස අඩි 05 අඟල් 2 1/2 ක් විය යුතුය.

1.3.3 වයස :

1.3.3.1 අවම සීමාව : අවුරුදු 18යි

1.3.3.2 උපරිම සීමාව : අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ දී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

1.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකදී සුදුසුකම් ලබාගත යුතුය.

1.3.4.1 ව්‍යුහගත පරීක්ෂණය :

1.3.4.1.2 ලකුණු ලබා දෙන ක්‍රමය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු ඉහලම ලකුණු ලැබුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |
| 2. මහාමාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

1.3.4 අදාළ වැටුප් ක්‍රමය (රා.ප.ච. 3/2016 අනුව)

PL3-2016 රු. 25,790-10x270-10 x 300-10 x 330 - 12 x 350- රු. 38,990 (නමුත් වැටුප් ගෙවීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක II හි සඳහන් පරිදි ඔබට වැටුප් ගෙවීම් සිදු කරනු ඇත.)

1.3.5 *වෙනත් සුදුසුකම්* :

(i) පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරු අදාළ පළාත් පාලන බල ප්‍රදේශය තුල වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
(iii) මහාමාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.
(iv) බඳවා ගැනීමට අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

02. ඖෂධ සංයෝජක තනතුර සඳහා සුදුසුකම් :

2.1 තනතුරු සංඛ්‍යාව : 01

2.2 වැටුප් පරිමාණය : PL 2-2016

මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් ක්‍රමය මාසිකව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව රු. 25,250-10x270-10x300-10x330-12x350- රු. 38,450 වනු ඇත. නමුත් වැටුප් ගෙවීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක II හි සඳහන් පරිදි ඔබට වැටුප් ගෙවීම් සිදු කරනු ඇත. III වන පන්තියට නියමිත වැටුප් පරිමාණයේ හතරවන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

2.3 *අධ්‍යාපන සුදුසුකම් :*

දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය.

2.3.1 *ශිල්පීය/ප්‍රවීණතා :*

අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතා පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්පත් කරගෙන තිබිය යුතුය.

*(අ)* වෘත්තියට අදාළව ජාතික වෘත්තිය සුදුසුකම් 2 වන මට්ටමේ ( NVQ 2 ) හෝ 3 වන මට්ටමේ ( NVQ 2) සහතිකය ලබා තිබීම;

හෝ

*(ආ)* කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ( DTET ) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම;

හෝ

*(ඇ)* ජාතික තරුණ සේවා සභාවේ ( NYSC ) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතිකය ලබා තිබීම;

හෝ

*(ඈ)* ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA ) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම;

හෝ

*(ඉ)* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ( NAITA ) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදරා සහතිකය ලබා තිබීම;

හෝ

*(ඊ)* තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.

2.3.2 *පළපුරුද්ද :*

අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම. (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 02ක් වත් විය යුතුය.)

2.3.3 *වෙනත් සුදුසුකම් :* අදළ තනතුරට නියමිත නිපුණතාවයක් පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්පත් කර ගෙන තිබිය යුතුය.

2.3.4 *වයස :*
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් සභා රාජ්‍ය සේවයක සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාවක් අදළ නොවේ.)

2.3.5 *බඳවා ගැනීමේ ක්‍රමය :*

මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත සේවයට බඳවා ගැනීම අදළ පළාත් පාලන ආයතනයේ පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ පොදු කොන්දේසි :*

* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ. තව ද, වැන්දඹු වැන්දඹු, පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය. මේ සම්බන්ධව රජය විසින් වරින්වර නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
* එසේම රාජ්‍ය සේවා පත් කිරීම අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.
* රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත් දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කල හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කළ යුතුය.
* තෝරාගනු ලබන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වන අතර, එම කාලය තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායක තත්වය නොමැති වුවහොත් ඉවත් කරනු ලැබේ.
* බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

04. *වෙනත් පොදු කොන්දේසි :*

* ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අදළ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචි ඇති අයෙක් විය යුතුය.
* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
* අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
* විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම් අවලංගු කරනු ලැබේ.
* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
* අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පන්විල ප්‍රාදේශීය සභා සීමාව තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචි ඇති අයෙක් විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් සනාථ කල යුතුය.) පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස, පළමුව පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගන්නා අතර අප පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට තෝරා ගැනීමට සුදුස්සන් ප්‍රමාණවත් නොවූ විටක, යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ අයදුම්පත් භාර ගනු ලැබේ.
* රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය විය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය.
* රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීම හැර) දඬුවමක් ලබා නැත්තා වූද මෙම කාලය තුළ යෙදුනු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබා ගන්නා වූද සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. තෝරාගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතුය.
* වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව අයදුම්කරු ත්‍රිවිධ හමුදාව හා ආරක්ෂක සේවයේ නිරත වී සිට විධිමත් පරිදි සේවයෙන් මුදා නොහැරි අය නොවිය යුතුය.
* මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, මධ්‍යම පළාත් සභාව හෝ පන්විල ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.
* කිසිදු තනතුරක් සඳහා පූජ්‍ය/පූජක පක්ෂයේ අයදුම්කරුවකු නොවිය යුතුය.
* මෙම බඳවා ගැනීමේ නිවේදනය විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද පන්විල ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

*අයදුම් කල යුතු ආකාරය ‍:*

මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් සමග 2019.06.28 දිනට ප්‍රථම මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික හා වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතික,
3. පදිංචිය පිළිබඳව ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ යුතුය).
4. මෑතකදී ලබාගත් චරිත සහතිකය.

වාසනා කුමාරි විජේසේන,
ලේකම්,
පන්විල ප්‍රාදේශීය සභාව.

2019 මැයි මස 23 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම***
***පන්විල ප්‍රාදේශීය සභාව***

01. 1.1 මුලකුරු සමග නම :——————————
    1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————
02. ස්ථිර ලිපිනය :——————————
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————
04. ජාතික හැඳුනුම්පත් අංකය :——————————
05. උපන් දිනය ‍: වර්ෂය:—————— මාසය:—————— දිනය:——————
06. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස:——————
07. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————
08. විවාහක/අවිවාහක බව :——————————
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් වන්නේ උපතින්ද/ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————
10. අධ්‍යාපන සුදුසුකම් (සහතික වලපිටපත් ඇමිණිය යුතුයි)

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය ‍:

*පළමු වාරය ‍:*
සමත් වර්ෂය :——————
විභාග අංකය:——————

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

*දෙවන වාරය ‍:*
සමත් වර්ෂය:——————
විභාග අංකය:——————

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

11. (1) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :——————————
(2) වෘත්තීය සුදුසුකම් :——————————
(3) සේවා පළපුරුද්ද :——————————

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර ස්ථිර/ අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත්/ආදේශකද යන වග, එම තනතුරට පත් වූ දිනය :——————————

13. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? එසේනම් ඒ පිළිබඳ විස්තර : :——————————

——————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන.......................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කල හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි).

දිනය :——————————

06-175

---

## පන්නල ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ පන්නල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුවී ඇති ප්‍රාථමික ශ්‍රේණිවල පහත සඳහන් තනතුරුවලට බඳවාගැනීම් සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පන්නල ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා සේවකයින් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| ශිල්පීය නොවන - III ශ්‍රේණිය සෞඛ්‍ය කම්කරු | 02 | රා.ප.ච. 3/2016 අනුව PL-1 වැටුප් කේතය යටතේ රු. 24,250-10x270-10 x300-12x330-රු. 36,410 වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවනු ලැබේ. | රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුයි. |
| ශිල්පීය නොවන - III ශ්‍රේණිය වැඩ ක්ෂේත්‍ර කම්කරු | 04 | රා.ප.ච. 3/2016 අනුව PL - 1 වැටුප් කේතය යටතේ රු.24,250-10x250-10x270-10 x300-12x330-රු.36,410 වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවනු ලැබේ. | අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයන් 02ක් සමත්වීම (වෛකල්පිත විෂයයන් හැර) |

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| ශිල්පීය නොවන - III ශ්‍රේණිය මුරකරු | 02 | රා.ප.ච. 3/2016 අනුව PL -1 වැටුප් කේතය යටතේ රු. 24,250-10x250-10x270-10 x 300-12x330- රු. 36,410 වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවනු ලැබේ. | අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයන් 02ක් සමත් වීම (වෛකල්පිත විෂයයන් හැර) |
| ශිල්පීය නොවන - III ශ්‍රේණිය පුස්තකාල උපස්ථායක | 03 | රා.ප.ච. 3/2016 අනුව PL - 1 වැටුප් කේතය යටතේ රු. 24,250-10x250-10x270-10 x300-12x330- රු. 36,410 වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවනු ලැබේ. | අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් විෂයන් 02ක් සමත්වීම (වෛකල්පිත විෂයයන් හැර) (උසස් පෙළ සමත් හා පුස්තකාල විද්‍යාව පිළිබඳ පිළිගත් පාඨමාලාවක් හදරා ඇති අයදුම්කරුවන් කෙරේ විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.) |
| අර්ධ ශිල්පීය - III ශ්‍රේණිය විදුලි කාර්මික | 01 | රා.ප.ච. 3/2016 අනුව PL -2 වැටුප් කේතය යටතේ රු.25,250-10x270-10x300-10 x330-12x350- රු. 38,450 වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවනු ලැබේ. | බාහිර අයදුම්කරුවන් සඳහා අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයන් 02ක් සමත් වීම. (වෛකල්පිත විෂයන් හැර) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් 8 ශ්‍රේණිය (9 වසර) සමත්වීම |
| අර්ධ ශිල්පීය - III ශ්‍රේණිය ආදාහනාගාර ක්‍රියාකරු | 01 | රා.ප.ච 3/2016 අනුව PL- 2 වැටුප් කේතය යටතේ රු. 25,250 - 10x270-10x300-10x330-12x350- රු. 38,450 වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවනු ලැබේ. | බාහිර අයදුම්කරුවන් සඳහා අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයන් 02ක් සමත් වීම. (වෛකල්පිත විෂයන් හැර) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් 8 ශ්‍රේණිය (9 වසර) සමත්වීම. |

02. *අර්ධ ශිල්පීය III සේවක ගණයට බඳවා ගැනීම - අවශ්‍ය ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා*

* *විදුලි කාර්මික :*

(i) රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය.

(ii) දෙපාර්තමේන්තු සේවකයින් සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අවසාන සහතිකපත්‍ර විභාගය හෝ කාර්මික විද්‍යාලයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ අවසාන පුහුණු සහතිකය.

(iii) පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්දක් තිබීම. (සේවා සහතිකය මගින් සනාථ කළ යුතුවේ.)

03. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුයි.

(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුයි.

(iii) පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවම වශයෙන් වසර 03ක කාලයක් තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. (ඡන්ද හිමි නාමලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)

(iv) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණයක් මගින් තනතුර අනුව වාචික/ප්‍රායෝගික හා න්‍යායාත්මක පරීක්ෂණයකින් පසු සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

05. *සේවය නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, වයඹ පළාත් රාජ්‍ය සේවා කොන්දේසි හා රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනයට අදාළ පනත්වල විධිවිධානවලට ද පන්නල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුව ද කටයුතු කිරීමට එකඟ විය යුතුය.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත 2019.07.08 හෝ එදිනට පෙර ''ලේකම්, පන්නල ප්‍රාදේශීය සභාව, පන්නල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

(ii) අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙලවරේ අදළ තනතුර සඳහන් කර ''.......................................... තනතුර සඳහා අයදුම්පත'' යනුවෙන් සඳහන් කර අයදුම්පත එවිය යුතුය.

(iii) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය,
*(ආ)* අධ්‍යාපන සහතික,
*(ඇ)* පාසලෙන් අස්වීමේ සහතිකය,
*(ඈ)* පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය, (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය)
*(ඉ)* මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්,
*(ඊ)* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරේ දී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පන්නල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

කේ. ආර්. පී. ජී. ආර්. කරුණානායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
පන්නල.

2019 මැයි මස 22 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභාව,
පන්නල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***පන්නල ප්‍රාදේශීය සභාව***

*පන්නල ප්‍රාදේශීය සභාවේ . . . . . .  . . . . . තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————
3. ස්ථිර පදිංචි ලිපිනය:——————————
4. ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා අංකය:——————————
5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:——————————
6. දිස්ත්‍රික්කය:——————————
7. උපන් දිනය ඃ

   වර්ෂය:———— මාසය:————දිනය:————
8. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස

   අවුරුදු:———— මාස:———— දින:————
9. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————
10. විවාහක/අවිවාහක බව:——————————
11. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද එසේනම් පරම්පරාවෙන්ද, ලියාපදිංචිවීමෙන්ද යන වග:——————————
12. ජාතික හැඳුනුම්පත් අංකය:——————————
13. අධ්‍යාපන සුදුසුකම් :——————————

    විභාගය:——————————

    වර්ෂය :———— විභාග අංකය :————

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |

14. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :——————————
15. සේවා පළපුරුද්ද :——————————
16. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ආදේශක/අනියම් ලෙස සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර

    එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම මතද යන වග) :——————————

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවාගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවාගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද දනිමි.

_________________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :________________

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්කරු වන . . . . . . . . . මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ . . . . . . . . . . වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කල හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයෙන් හෝ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුල දී විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවට එකී පූර්වාසන්න වසර 05 තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවද, මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

________________

ලේකම්,
පන්නල ප්‍රාදේශීය සභාව.

දිනය :________________.

06-142

---

## හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

හාරිස්පත්තුවේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් නියමිත සුදුසුකම් සපුරා ඇති හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|
| 01. | රියැදුරු | 01 | අංක 3/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ පීඑල් 3-2016 රු. 25,790-10x270-10 x 300-10 x 330-12 x 350-රු. 38,990 |

***විවෘත බඳවා ගැනීම :***

බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

***අධ්‍යාපන සුදුසුකම් :***

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් හයක් (06) සමත්ව තිබීම මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුය.

***වෘත්තීය සුදුසුකම් :***

තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගින් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයා හැකි බස් රථ සඳහා රියැදුරු

බලපත්‍රයක් ලබා තිබිය යුතුය. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

*පළපුරුද්ද :*

මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය)

*කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

අවම උස අඩි 05 අඟල් 2 1/2 ක් විය යුතුය.

*වයස :*

අවම සීමාව : අවුරුදු 18 යි.
උපරිම සීමාව : අවුරුදු 45 යි

*බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ.

*පළාත් පාලන රියදුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය :*

01. **විභාගය පිළිබඳ විස්තර :**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | මුළු ලකුණු සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |

02. මෙම පරීක්ෂණය අදාළ පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලැබේ.

03. තරග විභාගයට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ.

04. සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබා ගත යුතුවේ.

05. **විභාගය සඳහා විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවර්ණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි |

* ඉහත පරිදි පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් පවතින පුරප්පාඩු මත වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*වෘත්තීය පරීක්ෂණය :*

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.<br>අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ. |
| 2. මහා මාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

*වෙනත් :*

1. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරු අදළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
3. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
4. මහාමාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙක් වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
6. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූ හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූ අයෙකු නොවිය යුතුය.
7. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

***සීමිත බඳවා ගැනීම :***

දැනටමත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ තනතුරක ස්ථිර කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති සේවකයන් සඳහා අදළ වේ.

බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

*අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් හයක් (06) සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුය.

*වෘත්තීය සුදුසුකම් :*

තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුය. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

*පළපුරුද්ද :*

මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

*කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

අවම උස අඩි 05 අඟල් 2, 1/2ක් විය යුතුය.

*වෙනත් :*

1. අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
2. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
3. මාර්ග නීති සහ මාර්ග සංඥා පිළිබඳ මනා දැනුමකින් යුක්ත විය යුතුය.
4. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

*වයස :*

අවම සීමාව : අවුරුදු 18 යි.
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබාගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකදී සුදුසුකම් ලබා ගත යුතුය.

*ව්‍යුහගත පරීක්ෂණය :*

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% ක් හෝ ඊට වැඩි අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණය මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ. |
| 2. මහා මාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

*සේවා කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
3. තෝරාගනු ලබන සේවකයා අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.
4. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසි වලටද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවය හෝ රජයේ දෙපාර්තමේන්තු හෝ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

ඉල්ලුම් කළ යුතු ආකාරය ඃ

මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස් කර 2019.06.28 දිනට පෙර ලේකම් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව, තිත්තපජ්ජල, වැරැල්ලගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාල තනතුරේ නම සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු වේ.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
4. වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික,
5. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික,
6. පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය,
7. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.

මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුරදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීමේ බලය හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

සී. පී. නවරත්න,
ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2019 මැයි මස 22 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
තිත්තපජ්ජල,
වැරැල්ලගම.

ආදර්ශ අයදුම්පත්‍රය

**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව**

***තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————————
02. තැපැල් ලිපිනය :————————
03. උපන් දිනය : අවුරුද්ද :———— මාසය :———— දිනය :————
04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු :———— මාස:———— දින:————
05. ස්ත්‍රී/පුරුෂ භාවය :————————
06. විවාහක/අවිවාහක බව:————————
07. ජාතික හැඳුනුම්පත් අංකය :————————
08. රියදුරු බලපත්‍ර බාණ්ඩය:————————
09. රියදුරු බලපත්‍ර අංකය :————————
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද/එසේ නම්:————————
පරම්පරාවෙන්ද/ලියාපදිංචි වීමෙන් ද යන වග
11. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය:————————

12. අධ්‍යාපන සුදුසුකම් :

වර්ෂය :——————

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

13. වෙනත් සුදුසුකම් :——————————————

14. සේවා පළපුරුද්ද :——————————————

15. යම්කිසි වරදකට හෝ කෙදිනක හෝ උසාවියකදී වැරදිකරු වී ඇත්නම් ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න.
:——————————————

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් නුසුදුස්සෙකු බවට පත්වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට සිදුවන බවත් දනිමි.

——————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

06 - 233

---

## බද්දේගම ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු පිරවීම

බද්දේගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගාල්ල දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | සේවා ශ්‍රේණිය හා ශ්‍රේණිය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අවශ්‍ය අවම සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|---|---|---|---|---|
| 01 | ආයුර්වේද සංයෝජක | ප්‍රාථමික අර්ධ ශිල්පීය III ශ්‍රේණිය | 02 | PL-2 2016 | රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 | i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයක් (06) ක් සමත් වී තිබිය යුතුය.<br>ii. තනතුරට නියමිත පරිදි තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම.<br>iii. අදාළ කේෂ්ත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 02 | මුරකරු | ප්‍රාථමික ශිල්පීය නොවන III | 02 | PL1- 2016 | රු. 24,250- 10 x 250 -10 x 270- 10 x 300 - 12 x 320 - රු. 36,410 | i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් (06) ක් සමත් වී තිබිය යුතුය. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *සේවා ගණය හා ශ්‍රේණිය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අවශ්‍ය අවම සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|---|---|
| 03 | පුස්තකාල සහායක | ප්‍රාථමික ශිල්පීය නොවන III | 02 | PL 1-2016 | රු. 24,250- 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 320 - රු. 36,410 | i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. |
| 04 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන III | 02 | PL 1-2016 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 -12 x 320 - රු.36,410 | i. 8 වන ශ්‍රේණිය ( 9 වසර) සමත්ව තිබීම. |
| 05 | සෞඛ්‍ය කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන III | 01 | PL 1-2016 | රු. 24,250- 10 x 250 -10 x 270 - 10 x 300 -12 x 320 -රු. 36,410 | i. 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |
| 06 | බර උපකරණ යන්ත්‍ර ක්‍රියාකරු (කොන්ත්‍රාත් පදනම මත) | ප්‍රාථමික ශිල්පීය III | 01 | PL3-2016 | රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | i. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයන් 06 ක් සමත් වී තිබිය යුතුය.<br>ii. බර උපකරණ යන්ත්‍ර ක්‍රියාකරවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද දල බර වාහන රියදුරු බලපත්‍රයක් හා ඒ සම්බන්ධව නිපුනත්වය පිළිබඳ සහතිකයක් (NVQ-4) ලබා සිටිය යුතුය.<br>iii. රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. |

2. *වයස් සීමාව :*

(i) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

(ii) දැනටමත් දකුණු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුක්ත තැනැත්තන්ට, උපරිම වයස්සීමාව අදාළ නොවේ.

03. *පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සහා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 3 ස්ථිර පදිංචිය සනාථ කළ යුතුයි. (බද්දේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිය ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ii) අයදුම්කරුවන් යහපත් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත අය විය යුතුය.

(iii) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු වී දඩුවම් ලැබුවෙකු හෝ රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතුය.

(iv) අයදුම්කරුවන් අදාළ තනතුර සඳහා සඳහන් වී ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(v) දැනටමත් බද්දේගම ප්‍රාදේශීය සභාවේ ඉහත තනතුරුවල අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ දෛනික පදනම මත සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

(vi) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

(vii) බද්දේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සුදුස්සන් තෝරා ගැනීමට නොහැකි වූ විට පමණක් යාබද පළාත් පාලන ආයතනවල ප්‍රදේශවල පදිංචිකරුවන්ගෙන් සුදුස්සන් බඳවා ගනු ලැබේ.

04. *පොදු කොන්දේසි :-*

(i) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය බද්දේගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සතුය.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් මාස 3 ක් ඇතුළත රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බැව් පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

* බරවාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර හැර අනෙකුත් තනතුරු සඳහා :

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රම වැටුප් සහිතය. එසේ වුවද විශ්‍රාම වැටුප් සම්බන්ධව රජය විසින් ගන්නා ඕනෑම ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.

(ii) වැන්දඹු/පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

(iii) බඳවා ගනු ලබන අය වසර 03ක පරිවාස කාලයකට යටත් ය. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

(iv) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

(vi) බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට ද, ආයතන සංග්‍රහය හා නීතිරීති වලට ද, දකුණු පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා පළාත් පාලන දෙපාර්තමේන්තුව පනවනු ලබන කොන්දේසි හා රෙගුලාසිවලටද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥා අනපනත්, නීති රීති හා විධිවිධානවලටද, බද්දේගම ප්‍රාදේශීය සභාව පනවනු ලබන නියෝග වලටද යටත් විය යුතුය.

* බරවාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) ඉහත අනු අංක V, VI යටතේ දක්වා ඇති සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

(ii) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දයක විය යුතුය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. නියමිත සුදුසුකම් සපුරන අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය ප්‍රවීණතා තහවුරුකර ගැනීමේ පරීක්ෂණයකට යොමු කරන අතර එහි ප්‍රතිඵල මත බඳවා ගැනේ.

07. ලකුණු ලබා දීමේ ක්‍රමවේදය :-

ප්‍රාථමික ශිල්පීය හා අර්ධ ශිල්පීය සේවා ගණය :

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 30 |
| වෘත්තීය සුදුසුකම් | 10 |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද | 20 |
| සභා බල ප්‍රදේශයේ පදිංචිය (එක් වසරකට ලකුණු 5 බැගින්) | 35 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 05 |
| එකතුව | 100 |

ප්‍රාථමික ශිල්පීය නොවන ඃ

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 30 |
| අමතර සුදුසුකම් | 20 |
| සභා බල ප්‍රදේශයේ පදිංචිය (එක් වසරකට ලකුණු 5 බැගින්) | 35 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 15 |
| මුළු ලකුණු | 100 |

08. *අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය ඃ-*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත් 2019.06.21 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ''සභාපති, බද්දේගම ප්‍රාදේශීය සභාව, බද්දේගම'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල බද්දේගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සතුය.

අයදුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුය.

- උප්පැන්න සහතිකය;
- ජාතික හැඳුනුම්පත;
- අධ්‍යාපන සහතික, ඉහළම අධ්‍යාපන සුදුසුකම් දක්වෙන වෙනත් සහතික;
- පදිංචිය සනාථ කිරීමේ සහතිකය (පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් මාස 06 ක් තුළ දී නිකුත් කර, ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර තිබිය යුතුය.);
- මෑතක දී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක්;
- වෘත්තීය හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;
- වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

(මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ).

අනුර අමරසිරි නාරංගොඩ,
සභාපති,
බද්දේගම ප්‍රාදේශීය සභාව.

2019 මැයි මස 22 වැනි දින,
බද්දේගම ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

බද්දේගම ප්‍රාදේශීය සභාව

***.............................................. තනතුර බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) :——————————————
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————
3. ස්ථිර ලිපිනය :——————————————
4. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————— ග්‍රාම නිලධාරී වසම :——————

5. ජාතික හැඳුනුම්පත් අංකය :——————————

6. උපන් දිනය : වර්ෂය :———— මාසය:———— දිනය:————

7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :———— මාස :———— දින :————

8. විවාහක/අවිවාහක බව :——————————

9. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————

10. ජාතිය :——————————

11. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? පරම්පරාවෙන් ද?/ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————

12. ඔබ සාපරාධි වරදක් සම්බන්ධව උසාවියකින් වරදකරුවකු කර තිබේද?:——————————

13. දුරකථන අංකය :——————————

14. අධ්‍යාපන සුදුසුකම්

| අ.පො. ස. (සා/පෙළ) | අ.පො.ස. (උ. පෙළ) |
|---|---|
| .......................................... | ...................................... |
| .......................................... | ...................................... |
| .......................................... | ...................................... |
| .......................................... | ...................................... |
| .......................................... | |
| .......................................... | |
| .......................................... | |
| .......................................... | |
| .......................................... | |

15. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————
16. ඔබ දැනට බද්දේගම ප්‍රාදේශීය සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු නම්:

i. දැනට දරන තනතුර:————
ii. එම තනතුරට පත් වූ දිනය:————
iii. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ආදේශක/අනියම්/කොන්ත්‍රාත්/දෛනික පදනම ද යන වග):————
iv. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කර තිබේද ?:————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

————

අයදුම්කරුගේ අත්සන.

දිනය:————

*දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා ආයතන ප්‍රධානියාගේ අත්සන*

මෙම ආයතනයේ ........................ලෙස සේවය කරනු ලබන .........................මයා/මිය/මෙය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු කාර්යාලයීය ලිපි ලේඛන අනුව නිවැරදි වේ. මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළහැක.

————

ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:————
තනතුර:————
අත්සන:————

06-174

# පළාත් පාලන නිවේදන

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

### ප්‍රජා මණ්ඩල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

**නිවේදනයයි**

පස්බාගේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම, ඒවායේ කාර්යය හා කර්තව්‍ය තීරණය කිරීම හා නියාමනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) උප වගන්තිය ප්‍රකාරව 2018.08.30 වන දින අංක 02-09 යටතේ ගන්නා ලද තීරණය අනුව පහත සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2019 මැයි මස 16 වැනි දින.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2018.09.25 වන දින අංක 2090/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස් පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම, ඒවායේ කාර්යය හා කර්තව්‍ය තීරණය කිරීම හා නියාමනය කිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට පස්බාගේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018.08.30 වන දින පැවති මහා සභාවේ 02-09 යටතේ මෙයින් තීරණය කරමි.

06-16

---

## කරච්චි ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

කරච්චි ප්‍රාදේශීය සභාව විසින් 2018 නොවැම්බර් මස 28 වන දින පැවති මහ සභාවේ තීරණ අංක 09(ii) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. වේලමාලිදහිදන්,
සභාපති,
කරච්චි ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 28 වැනි දින,
කරච්චි ප්‍රාදේශීය සභාව,
කිලිනොච්චිය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කරච්චි ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපලකටම 2019 වර්ෂය සඳහා වරිපනම් පැනවීම සම්බන්ධයෙන් 2018 නොවැම්බර් මස 28 වැනි දින තීරණ අංක 08 (15) යටතේ පනවන ලද වරිපනම් බදු යෝජනාව පහත සඳහන් පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට කරච්චි ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කරච්චි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තිය අනුව දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ වල පිහිටි සෑම නිශ්චල දේපලකටම 2014 වර්ෂයේ නව තක්සේරුවෙන් ලත් වාර්ෂික වටිනාකම 2019 වර්ෂයේ වරිපනම් අය කිරීම සඳහා වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත් තක්සේරු ගත වාර්ෂික වටිනාකම මත වරිපනම් අය කිරීම් 2019.01.01 දින බලාත්මක කිරීමටත්,

(ඉ) 134 වැනි උප වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කරච්චි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපලකටම වාර්ෂික වටිනාකමින් පහත උපලේඛන අංක 1.11 සහ 111 හි ඇතුළත් මාර්ගවල සහ පාරවල්වල පිහිටි දේපලවලින් පිළිවෙලින් 10%, 06% ක යනාදී ලෙස වරිපනමක් 2019 වර්ෂයට නියම කොට පනවා අය කිරීම සහ,

(ඊ) 134 වැනි උප වගන්තියේ (06) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යථොක්ත වාර්ෂික වරිපනම් 2019 සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු 02 තුළදී සමාන වාරික 02කින් ප්‍රාදේශීය සභාවට ගෙවියයුතු යැයි විධාන කිරීමට කරච්චි ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

iii වැනි උපලේඛනය

| වරිපනම් බල ප්‍රදේශය අංකය | වරිපනම් බලප්‍රදේශය | වරිපනම් බලප්‍රදේශයේ ඇති ග්‍රාම නිලධාරි වසම් |
|---|---|---|
| 21 | කනගම්බිගෙයිකුලම් | තොණ්ඩමන්නගර් KN/17<br>කනගම්බිගෙයිකුලම් KN/18<br>අම්බාල් නගර් KN/19 |
| 09 | තිරුවෙයියාරු | තිරුවෙයියාරු බටහිර KN/20<br>තිරුවෙයියාරු නැගෙනහිර KN/21<br>මරුදනගර් KN/24 |
| 10 | කිලිනොච්චි නගරය | රතිනපුරම් KN/22<br>කිලිනොච්චි නගරය KN/23<br>ආනන්දපුරම් KN/16 |
| 11 | ගනේෂපුරම් | තිරුනගර් දකුණ KN/27<br>තිරුනගර් උතුර KN/28<br>ගනේෂපුරම් KN/29<br>ජයන්ත්නගර් KN/30 |
| 13 | උදයනගර් | විවේකානන්දනගර් KN/10<br>උදයනගර් නැගෙනහිර KN/12<br>උදයනගර් බටහිර KN/13<br>කනගපුරම් KN/26 |
| 19 | ක්‍රිෂ්ණපුරම් | ක්‍රිෂ්ණපුරම් KN/11<br>අම්බාල්කුලම් KN/14<br>සෙල්වනගර් KN/15 |
| 20 | බාරතීපුරම් | පොන්නගර් KN/07<br>බාරතීපුරම් KN/08<br>මලයාලපුරම් KN/09 |

06-153

## වව්නියා උතුරු ප්‍රාදේශීය සභාව

### වව්නියාව උතුරු පළාත ප්‍රාදේශීය සභාව වෙනුවෙන් අනුමත කරන ලද නියමයන් හා අතුරු ව්‍යවස්ථාව පිළිගැනීම

**1952 වර්ෂයේ අංක 6 දරන පළාත් පාලන සභාවේ නියමයන් හා අතුරු ව්‍යවස්ථා පනත**

1989 වර්ෂයේ අංක 12 දරන පළාත් සභා (අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවනු ලබන 1952 වර්ෂයේ අංක 6 දරන පළාත් පාලන සභා (අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තියේ පළාත් සභාවේ පළාත් පාලනයට භාරව කටයුතු කරන ඇමතිවරයා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාරව උතුරු පළාත පළාත් පාලන අමාත්‍ය විසින් 2018.05.09 වැනි දිනැති අංක 2070/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (අතිවිශෙෂ) පළ කරන ලද උතුරු පළාත ප්‍රාදේශීය සභාව වෙනුවෙන් අනුමත කරන ලද නියමයන්හි 7 සිට 9 දක්වා වවුනියාව දිස්ත්‍රික්කය තුළ පිහිටුවා තිබෙන වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ 2019.02.01 වන දින සිට ක්‍රියාත්මක කරන බව වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ 2019.01.17 වන දිනැති අංක VNPS/2019/GM/01/10/05 සභා රැස්වීමේ ගෙන එන ලද යෝජනාවෙන් පිළිගෙන තිබෙන බව 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 (2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. තනිකාසලම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුංකේනි.

06-99

---

## නිවිතිගල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නිවිතිගල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් නිවිතිගල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේනම් මේ නිවේදනයේ සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්ති ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් නිවිතිගල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කුලතුංග ලියනගේ,
සභාපති,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.

නිවිතගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**2019 මාර්තු මස 22 වැනි දින**

නිවිතගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | පොල්වත්ත ගෙපල මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | - | නිවිතිගල වටාපත ප්‍රධාන මාර්ගයේ එච්. ඒ. හිරිපිටිය මයාගේ ඉඩමෙන් ආරම්භකර කේ. ජී. වීරසේකර මයාගේ ඉඩමෙන් කොළඹගම වටාපත මාර්ගයට හැරෙන ස්ථානයෙන් අවසන් වේ. |
| ග්‍රාමසේවක වසම හා අංකය | - | වටාපත |
| මාර්ගයේ දිග පළල | - | කි. මී. 2.8024 පළල අඩි 8 |
| | | පොල්වත්ත ගෙපල පාර - SK 998 මිනින්දෝරු සැලැස්මේ 01, 02 සහ 03 පිටපත් අමුණා ඇත. |

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :**

| | | |
|---|---|---|
| එච්. ඒ. හිරිපිටිය ඉඩම | නිශාන්ති | පී. ජී. ඩිංගිරි මැණිකේ |
| එන්. ඒ. අමිල රුවන් | පුෂ්පා | ටී. චන්ද්‍රපාල |
| රවින්ද්‍ර | ගීතා | |
| එම්. ජී. පුංචි සිංඤ්ඤෝ | සෝමලතා | ජී. එම්. පොඩිමහත්තයා |
| ඒ. ඩබ්. චන්ද්‍රාවතී | සෝමසිරි | වටාපත දේවානන්ද පිරිවෙන |
| එම්. ඩබ්. තිමාවති | ජේ. වීරවර්ධන | |
| ආර්. උදයකුමාර | ටී. ඒ. එස්. ගාමිණී සහ අනෙකුත් අය | ඩබ්. එච්. එස්. වර්ණසිරි |
| බී. එල්. ඇල්බට් | ටී. ඒ. එස්. ගාමිණී | |
| ඩබ්. ඒ. චන්ද්‍රසිරි | කේ. යූ. ජී. මැණිකේ | |
| එම්. ඩබ්. තිමාවති | බී. ජී. වීරසේකර | |
| ටි. එල්. යූ. කුමාර | | |
| නිශාන්ත | | |

***මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් :***

| | | |
|---|---|---|
| එච්. ඒ. හිරිපිටිය | බී. පී. වීරසේකර | කේ. කේ. වී. ජයසේකර |
| එම්. ඒ. සරත් | පියදාස | |
| ජේ. චන්ද්‍රපාල | චන්ද්‍රසේන සහ අනෙකුත් අය | යූ. එම්. එන්. දයානන්ද |
| ඩබ්. ඒ. සරත් | බී. එල්. පී. සුසන්ත | |
| පී. ඒ. විජයසිරි | ඩබ්. එච්. ආර්. චන්ද්‍රතිලක සහ අනෙකුත් අය | වයි. ආර්. පොඩිමැණිකේ |
| සුනිල් | එච්. ජී. රත්නපාල | කේ.ජී. වීරසේකර |
| ඒ. එම්. කේ. ජයවර්ධන | කේ. ජී. විල්බට් | |
| ටී. වී. ඒ. විජයවර්ධන | ඩබ්. ආර්. එච්. ධනපාල | |
| ජී. සමන් | ආර්. ජිනදාස | |
| බී. එල්. දිල්හානි | කේ. යූ. එච්. මැණිකේ මිය | |

A.J. Sarath K. Bandara B.sc.(Pera) -
Registered Licensed Surveyor
277/C/4, 'Tusita' – Kandekumbura
Galagedara
L.S.C. Reg. No. – 19921240
TP 0775556455

Section 1 of 3 Sections

# To be Gazzatte the Pradeshiya Saba Road of Nivitigala

PLAN NO: SK298

SCALE 1:2000




Village : Watapatha
Polwatta Gepala
Koshinna
Minor Division : Mada Pattu of Nawadun Koralaya
D.S's Division : Nivitigala
District : Ratnapura
Province : Sabaragamuwa


REFERENCE
LF : Live Fence
B : Bank
U : Undefined
Road(RDA) : Road(Road Development Authority)

| Name of the Road | Length of the Road | Width of the Road | No.of Families | | GN Division |
|---|---|---|---|---|---|
| | | | Left | Right | |
| Polwatta Gepala Road | 1.8024 | 8ft | 39 | 35 | Watapatha |

Boundaries Pointed out By the Technical Officer of Nivitigala Pradeshiya Saba
Surveyed on 11 & 12 Feb. 2019
Date 13 Feb. 2019

SARATH K. BANDARA B.Sc (Pera),
Registered Licensed Surveyor
& Leveller
277/C/4, "Tusitha", Kandekumbura
Galagedara
Tel: 07 6450645
Reg.No. 19921240

A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor


A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor
277/C/4, 'Tusita' – Kandekumbura
Galagedara
L.S.C. Reg. No. – 19921240
TP 0775556455
To be Gazzatte the Pradeshiya Saba Road of Nivitigala
SCALE 1:2000
Section 2 of 3 Sections
PLAN NO: SK298
Village : Watapatha
Polwatta Gepala
Koshinna
Minor Division : Mada Pattu of
Nawadun Koralaya
D.S's Division : Nivitigala
District : Ratnapura
Province : Sabaragamuwa
Section 1
Land Claimed by Somasiri & Others
Land Claimed by Somasiri
Land Claimed by W.H.R.Chanathilaka & Others
Land Claimed by R.Udayakumara
Land Claimant Unknown
Land Claimed by B.L.P.Susantha
Land Claimed by J.Weerawardana
Land Claimed by W.H.R.Chanathilaka & Others
Land Claimed by T.A.S.Gamini & Others
Land Claimed by H.G.Rathnapala
Land Claimed by K.G.Wilbert
Land Claimed by T.A.S.Gamini
Land Claimed by W.H.R.Danapala
Land Claimant Unknown
Land Claimed by K.U.G.Manike
Land Claimed by P.R.Jinadasa
Land Claimed by P.R.Jinadasa
Land Claimed by K.U.H.Manike
Land Claimant Unknown
Section 3
REFERENCE
LF : Live Fence
B : Bank
U : Undefined
Road(RDA) : Road(Road Development Authority)
Boundaries Pointed out By the Technical Officer of Nivitigala Pradeshiya Saba
Surveyed on 11 & 12 Feb. 2019
Date 13 Feb. 2019
SARATH K. BANDARA B.Sc (Pera)
Registered Licensed Surveyor
& Leveller
A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor


A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor
277/C/4, 'Tusita' – Kandekumbura
Galagedara
L.S.C. Reg. No. – 19921240
TP 0775556455

Section 3 of 3 Sections

# To be Gazzatte the Pradeshiya Saba Road of Nivitigala

PLAN NO: SK298

SCALE 1:2000




| | | |
|---|---|---|
| Village | : | Watapatha<br>Polwatta Gepala<br>Koshinna |
| Minor Division | : | Mada Pattu of<br>Nawadun Koralaya |
| D.S's Division | : | Nivitigala |
| District | : | Ratnapura |
| Province | : | Sabaragamuwa |

REFERENCE

| | | |
|---|---|---|
| LF | : | Live Fence |
| B | : | Bank |
| U | : | Undefined |
| Road(RDA) | : | Road(Road Development Authority) |

Boundaries Pointed out By the Technical Officer of Nivitigala Pradeshiya Saba
Surveyed on 11 & 12 Feb. 2019
Date 13 Feb. 2019

SARATH K. BANDARA B.Sc.(Pera)
Registered Licensed Surveyor
& Leveller
277/C/4, "Tusitha" Kandekumbura
Galagedara
T.p: 07 -6460645
Reg.No. 19921240

A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor

කෝට්ටේ ගංගොඩ පාර SK 287 මිනින්දෝරු සැලැස්ම 01 සහ 02 පිටපත් මෙයට අමුණා ඇත.

**2019 මාර්තු මස 22 වැනි දින**
නිවිතිගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | කෝට්ටේ ගංගොඩ පාර |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | - | නිවිතිගල කලවාන ප්‍රධාන මාර්ගයේ වම්පස එච්. බී. වී. විජේසිංහ සහ කේ. ජී. වී. කහංගම ඉඩමෙන් ආරම්භ කර කේ. ආර්. ඩිංගිරි මහත්තයා සහ ජේ. කරුණාරත්න ඉඩමෙන් අවසන් වී නිවිතිගල කොළඹගම නිවිතිගල කොළඹගම මාර්ගයට පිවිසේ |
| ග්‍රාමසේවක වසම හා අංකය | - | සිදුරුපිටිය |
| මාර්ගයේ දිග පළල | - | 1.0949 කි. මී. පළල අඩි 8 |

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම්**

| | |
|---|---|
| එච්. බී. වී. විජේසිංහ ඉඩම | තේගිරිස් |
| බී. සිරිපාල | කේ. ජී. එස්. කහංගම |
| එච්. ආර්. වී. ජයසේකර | කේ. ජී. අනුලාවතී |
| ඩාවිෂ් සියෝඤ්ඤා | කේ. ජී. ප්‍රියංජන සහ අනෙකුත් අය |
| ඩාවිෂ් සියෝඤ්ඤා | කේ. ජී. සිරිසේන |
| ඩාවිෂ් සියෝඤ්ඤා | ජී. බෙරබදුගේ |
| ඩාවිෂ් සියෝඤ්ඤා | ඉඩම් හිමියන් හඳුනාගත නොහැක. |
| ඕ. විජේවීර | කේ. ජී. පීටර් සහ පවුලේ අය |
| කේ. ජී. ගුණසේකර | පී. කරුණාරත්න |
| කේ. බී. ඒ. දයාවතී | බී. ජේ. චන්න |
| එන්. ඒ. පොජිනි | යූ. ඩී. ජිනදස |
| එන්. ගුණතිලක | කේ. ආර්. ඩිංගිරිමහත්තයා |

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමින්ගේ නම්**

| | | |
|---|---|---|
| කේ. ජී. ඩී. කහංගම | එච්.කේ. එච්. ගුණරත්න | පී. කරුණාරත්න |
| එච්. කේ. සුනිල් | කේ. ජී. පියසේන | බී. ජේ. චන්න |
| බී. එන්. අනිල් | කේ. ජී. එස්. චමින්ද | යූ. ඩී. ජිනදස |
| කේ. ජී. ජයතිස්ස | කේ. ජී. ප්‍රනීත් සහ පවුලේ අය | එම්. ඩබ්. කේ. ගලප්පත්ති |
| ඩාවිෂ් සියෝඤ්ඤා | ඩී. යූ ගුණසිංහ | ඩී. ජයසේන |
| කේ. ජී. තේගිරිස් | පී. ජයන්ත | කේ. ඒ. සමන්ති |
| කේ. ජී. කරුණාරත්න | පී. ඩී. ප්‍රියලතා | ජේ. කරුණාරත්න |
| කේ. ජී. ප්‍රියංජන සහ පවුලේ අය | කේ. ජී, එස්. ගමගේ | |
| එස්. විජේසිංහ පවුලේ අය | කේ. ජී. පීටර් | |
| ජී. සිරිසේන සහ පවුලේ අය | යූ. ඩී. සෝමපාල | |
| කේ. බී. එස්. නිලන්ත | එම්. ඩබ්. පොඩිමහත්තයා | |
| ඩබ්. පී. දයානන්ද | පී. ගුණතිලක | |


A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor
277/C/4, 'Tusita' – Kandekumbura
Galagedara
L.S.C. Reg. No. – 19921240
TP 0775556455


Section 1 of 2 Sections

# To be Gazzatte the Pradeshiya Saba Road of Nivitigala

PLAN NO: SK287

SCALE 1:2000






Village : Nivitigala
Minor Division : Mada Pattu of Nawadun Koralaya
D.S's Division : Nivitigala
District : Ratnapura
Province : Sabaragamuwa

REFERENCE
OLM : Old Land Mark
LF : Live Fence
B : Bank
Road(RDA) : Road(Road Development Authority)

| Name of the Road | Length of the Road | Width of the Road | No.of Families | | GN Division |
|---|---|---|---|---|---|
| | | | Left | Right | |
| Gangoda Road | 1.0949km | 8ft | 35 | 23 | Nivitigala |

Boundaries Pointed out By the Technical Officer of Nivitigala Pradeshiya Saba
Surveyed on 25, 26 & 27 Jan. 2019
Date 28 Jan. 2019

SARATH K. BANDARA B.Sc (Pera)
Registered Licensed Surveyor & Leveller
277/C/4, 'Tusitha', Kandekumbura
Galagedara

A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor


Section 2 of 2 Sections

A.J. Sarath K. Bandara- B.sc.(Pera)
Registered Licensed Surveyor
277/C/4, 'Tusita' – Kandekumbura
Galagedara
L.S.C. Reg. No. – 19921240
TP 0775556455

# To be Gazzatte the Pradeshiya Saba Road of Nivitigala

PLAN NO: SK287

SCALE 1:2000




| | |
|---|---|
| Village | : Nivitigala |
| Minor Division | : Mada Pattu of Nawadun Koralaya |
| D.S's Division | : Nivitigala |
| District | : Ratnapura |
| Province | : Sabaragamuwa |

REFERENCE

OLM : Old Land Mark
LF : Live Fence
B : Bank
Road(RDA) : Road(Road Development Authority)

Boundaries Pointed out By the Technical Officer of Nivitigala Pradeshiya Saba
Surveyed on 25, 26 & 27 Jan. 2019
Date 28 Jan. 2019

SARATH K. BANDARA B.Sc.(Pera)
Registered Licensed Surveyor
& Leveller

A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor

එගොඩ නිවිතිගල පාර මිනින්දෝරු සැලැස්ම SK 288 01, 02 සහ 03 ට අනුව පිටපත් අමුණා ඇත.

**2019 මාර්තු මස 22 වැනි දින**

නිවිතිගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | එගොඩ නිවිතිගල පාර |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | - | රත්නපුර කලවාන පාර වම්පස ඇල්ෆා උසස් අධ්‍යාපන ආයතනය ඩිංගිරි මහතා, ඉඩම අවසානය පී. ජී. ධම්මික මහතාගේ ඉඩමෙන් නිවිතිගල වටාපත පාර |
| ග්‍රාමසේවක වසම හා අංකය | - | නිවිතිගල |
| මාර්ගයේ දිග පළල | - | 1.8111 කි.මී. පළල අඩි 8 |

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම්**

| | | |
|---|---|---|
| ඩිංගිරි මහත්තයා | ජී. ඒ. ගුනපාල | |
| හිමිකම් තහවුරු නොවූ ඉඩම | ඩබ්. එන්. නිහාල් | ගුණරත්නගේ ඉඩම |
| සුමනරත්නගේ ඉඩම | එම්. ඒ. සුමින්ද | |
| ඩබ්. ඒ. නිමල් | කරුණාවතී | |
| පී. බී. දයානන්ද | පී.එච්. අමරසිංහ | |
| පී. පී. අමරත්න | හිමිකම් තහවුරු නැත | |
| එ. ඩී. වික්‍රමසිංහ | පී. ජී. කේ.නානායක්කාර | |
| කේ. පී. ගුණරත්න | සිරිබෝහාමි | |
| හිමිකම් තහවුරු නොවූ ඉඩම | ලක්ෂ්මන් දිසානායක | |
| ආර්.ඒ. නුවන් | වික්‍රමපාල | |
| අසේල ලක්ෂිත | ජයනෙත්ති | |
| එච්. එස්. ආරියරත්න | තහවුරු නොවූ ඉඩම | |
| කේ. ප්‍රේමරත්න | එම්. එම්. චන්ද්‍රසේන | |
| ඩී. ප්‍රේමදාස | පී. එම්. ගුණවර්ධන | |
| ජී. සරත් කුමාර | ඩී. ජී. ජේ. සංජීව | |
| ඩබ්. විජේරත්න | ඩී. ජී ජේ. සංජීව | |
| සුමිත් | ඩී. ජී. ජේ. සංජීව | |
| ටී. ඩබ්. තුෂාර | ඩී. ජී. සිරිසේන | |
| සුජිත් කැටවල | එච්. එල්. ප්‍රේමරත්න | |
| එම්. ඩී. අනුලා රෝහිණී | එම්. එම්. ගාමිණී විජයලාල් | |
| ඩබ්. ඒ. ආරියරත්න | කේ. ඩබ්. එස්. කුමාර | |
| ඩබ්. ප්‍රේමචන්ද්‍ර | ඩබ්. විජේරත්න | |
| කේ. ඩී. සිරිසේන | චමිලා | |
| හිමිකම් තහවුරු නොවූ ඉඩම | යූ. ඩී. සෝමදාස | |
| සෝමසිරි | | |
| ඩබ්. කරුණාදාස | | |
| හිමකම් තහවුරු නොවූ ඉඩම | | |
| ජී. ඒ. නිමල් | | |

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම්**

| | |
|---|---|
| අයිතිය තහවුරු නොවූ වෙල්යාය | එච්. රත්මැණිකේ |
| එම | ඒ. එන්. කේ. නානායක්කාර |
| එම | |
| එම | හිමිකම් තහවුරු නොවූ වෙල |
| එම්. ඩී. උපාලි | |
| ඊ. ජී. ආනන්දපාල | අජිත් වීරසිංහ |
| පී. බී. ලීලාරත්න | අනුරුද්ධ නානයක්කාර |
| ඩී. එම්. විජේවර්ධන | ඩබ්. දයාරත්න |
| හිමිකම් තහවුරු නොවූ ඉඩම | ඩී. ජී. චින්තක |
| ඩී. ප්‍රේමලතා | ඩී. ජී. චින්තක |
| ඩී. චන්ද්‍රලතා | හිමිකම් තහවුරු නොවූ වෙල |
| ඩී. ප්‍රේමදාස | හිමිකම් තහවුරු නොවූ වෙල |
| ඩී. ටී. පියසීලි | හිමිකම් තහවුරු නොවූ වෙල |
| ඩී. ටී. රත්නසිරි | හිමිකම් තහවුරු නොවූ වෙල |
| ටී. සමීර | හිමිකම් තහවුරු නොවූ වෙල |
| එම්. ඩී. අනුලා රෝහිණී | හිමිකම් තහවුරු නොවූ වෙල |
| එම්. ඩී. අනුලා රෝහිණී | පී. ජී. ධම්මික |
| එම්. ඩී. අනුලා රෝහිණී | |
| හිමිකම් තහවුරු නොවූ වෙල | |
| එම | |
| එම | |
| පී. ඒකනායක | |
| හිමිකම් තහවුරු නොවූ වෙල | |
| එම්. ලක්ෂ්මන් | |

බලයලත් මිනින්දෝරු ඒ. ජේ. සරත් කේ. බණ්ඩාර මයාගේ 2019.02.13 වැනි දින මනින ලද පිඹුරුපත් අංක SK 298 දරන පිඹුරුපත අනුව වේ.

A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor
277/C/4, 'Tusita' – Kondekumbura
Galagedara
L.S.C. Reg. No. – 19921240
TP 0775556455


Section 1 of 3 Sections

# To be Gazzatte the Pradeshiya Saba Road of Nivitigala

PLAN NO: SK288

SCALE - 1:2000

Village : Nivitigala
Minor Division : Mada Pattu of Nawadun Koralay
D.S's Division : Nivitigala
District : Ratnapura
Province : Sabaragamuwa




REFERENCE


BW : Boundary Wall
LF : Live Fence
B : Bank
U : Undefined
Road(RDA) : Road(Road Development Authority)

| Name of the Road | Length of the Road | Width of the Road | No.of Families | | GN Division |
|---|---|---|---|---|---|
| | | | Left | Right | |
| Egoda Nivitigala Road | 1.8111 | 8ft | 60 | 41 | Nivitigala |

Boundaries Pointed out By the Technical Officer of Nivitigala Pradeshiya Saba
Surveyed on 28 & 29 Jan. 2019
Date 30 Jan. 2019

SARATH K. BANDARA B.Sc (Pera)
Registered Licensed Surveyor
& Leveller
277/C/4, 'Tusitha'- Kandekumbura
Galagedara
T.p: 071-6460645
Reg.No. 1992 1240

A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor


A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor
277/C/4, 'Tusita' – Kandekumbura
Galagedara
L.S.C. Reg. No. – 19921240
TP 0775556455
To be Gazzatte the Pradeshiya Saba Road of Nivitigala
SCALE 1:2000
Section 2 of 3 Sections
PLAN NO: SK288
Village : Nivitigala
Minor Division : Mada Pattu.of Nawadun Koralaya
D.S's Division : Nivitigala
District : Ratnapura
Province : Sabaragamuwa
REFERENCE
BW : Boundary Wall
LF : Live Fence
B : Bank
U : Undefined
Road(RDA) : Road(Road Development Authority)
Section 1
Land Claimed by M.D.Anula Rohini
Can not be find the land owner
Land Claimed by K.D.Sirisena
Land Claimed by W.Premachandra
Land Claimed by W.A.Ariyarathna
Land Claimed by Somasiri
Land Claimed by W.Karunadasa
Can not be find the land owner
Land Claimed by
M. D. Anula Rohini
Can not be find the land owner Paddy Field
Land Claimed by G.A.Nimal
Land Claimed by G.A.Gunapala
Can not be find the land owner
Can not be find the land owner Paddy Field
Land Claimed by M.A.Suminda
Land Claimed by W.A.Nihal
Land Claimed by Karunawathi
Land Claimed by P.H.Amarasinghe
Can not be find the land owner
Can not be find the land owner Paddy Field
Land Claimed by P.Ekanayaka
Land Claimed by P.C.K.Nanayakkara
Land Claimed by Siribohami
Land Claimed by Laxman Disanayaka
Land Claimed by Wickramapala
Land Claimed by Piyadasa
Land Claimed by Jayaneththi
Can not be find the land owner
Land Claimed by M.Laxman
Land Claimed by H.Ranmenike
Land Claimed by A.N.K.Nanayakkara
Can not be find the land owner Paddy Field
Can not be find the land owner
Land Claimed by M.M.Chandrasena
Land Claimed by Ajith Weerasinghe
Land Claimed by Anuruddha Nanayakkara
Land Claimed by P.M.Gunawardhana
Land Claimed by W.Dayarathna
Land Claimed by D.G.J.Sanjeewa
Land Claimed by D.G.Chinthaka
Section 3
Boundaries Pointed out By the Technical Officer of Nivitigala Pradeshiya Saba
Surveyed on 28 & 29 Jan. 2019
Date 30 Jan. 2019
SARATH K. BANDARA B.Sc (Pera)
Registered Licensed Surveyor
& Leveller
277/C/4, 'Tusitha'- Kandekumbura
Galagedara
Reg.No. 19921240
A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor


A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor
277/C/4, 'Tusita' – Kandekumbura
Galagedara
L.S.C. Reg. No. – 19921240
TP 0775556455

# To be Gazzatte the Pradeshiya Saba Road of Nivitigala

Section 3 of 3 Sections

PLAN NO: SK288

SCALE 1:2000




Village : Nivitigala
Minor Division : Mada Pattu of Nawadun Koralaya
D.S's Division : Nivitigala
District : Ratnapura
Province : Sabaragamuwa

REFERENCE

BW : Boundary Wall
LF : Live Fence
B : Bank
U : Undefined
Road(RDA) : Road(Road Development Authority)

Boundaries Pointed out By the Technical Officer of Nivitigala Pradeshiya Saba
Surveyed on 28 & 29 Jan. 2019
Date 30 Jan. 2019

SARATH K. BANDARA B.Sc (Pera)
Registered Licensed Surveyor
& Leveller
277/C/4, "Tusitha", Kandekumbura
Galagedara
T.p: 07 -6460645
Reg.No. 19921240

A.J. Sarath K. Bandara B.sc.(Pera)
Registered Licensed Surveyor

06-17

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම් වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය නිවේදනය කිරීම ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(02) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.


ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

**ලියාපදිංචි කළ යුතු මාර්ග**

| *අනු. අංකය* | *ග්‍රාම නිලධාරී වසම* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* | *දිග (මීටර්)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | අංක 15 නාරංවල | අරඹේවත්ත මාර්ගය | නාරංවල ප්‍රධාන පාරේ සිට අමුකොටුව දක්වා පාරේ සිට | අරඹේවත්ත | 1. ආර්. එච්. එම්. කේ. ඒකනායක මයා<br><br>2 ඩී. තිලකරත්න මයා, තුන්මන් හන්දිය වත්ත | 1. ජේ. එම්. ජයන්ති කුමාර මිය අරඹේවත්ත<br><br>2. එච්. එම්. නිමල් අබේරත්න මයා, මරක්කලවත්ත *නොහොත්* තුන්මන් හන්දිය වත්ත<br><br>3. ඩී. එම්. උපාලි දිසානායක මරක්කලවත්ත *නොහොත්* තුන්මන් හන්දිය වත්ත | 100 | 8 |

| අනු. අංකය | ග්‍රාම නිලධාරි වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | දිග (මීටර්) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | අංක - 27 ගොඩපොල නැගෙනහිර | කැබැල්ලගොල්ල හේන මාර්ගය | රත්නායක මහතාගේ නිවස අසලින් | නවරත්න මහතාගේ නිවස අසලින් | 1. ඩබ්. එම්. සී. ඒ. බණ්ඩාර අබේරත්න මයා, කැබැල්ලගොල්ල හේන<br><br>2. ඩබ්. එම්. ඩී. ජී. එස්. කුමාරිහාමි අබේරත්න මිය, කැබැල්ලගොල්ල හේන<br><br>3. ඩබ්. එම්. ඩී.ජී. ජී. අබේරත්න කුමාරිහාමි මිය කැබැල්ලගොල්ල හේන | 1. එම්. ඒ. ඒ. ප්‍රභාෂි රත්නායක මිය, කැබැල්ලගොල්ල හේන<br><br>2. එම්. ඒ.එන්. තාරිකා රත්නායක මිය. කැබැල්ලගොල්ල හේන<br><br>3. එම්. ඒ. රත්නායක මයා, කැබැල්ලගොල්ල හේන<br><br>4. එම්. ඒ. නවරත්න බණ්ඩා මයා, කැබැල්ලගොල්ල හේන<br><br>5.එම්. ඒ. ඒ. සී. චමින්ද බණ්ඩාර මයා, කැබැල්ලගොල්ල හේන | 200 | 10 |

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.



පරිමාණය 1 : 1000

| [illegible] | ප්‍රමාණය | | | | [illegible] |
|---|---|---|---|---|---|
| | හෙක්ටයාර | අ. | රූ. | ප. | |
| A | 0.0596 | 0 | 0 | 23.66 | [illegible] |

ඩී.ඒ.තිලකරත්න

(ලියාපදිංචි අංකය : 19831290 / [illegible] : 20050054)

ලියාපදිංචි බලයලත් මිනින්දෝරු

2019.04.06

ඩී. ඒ. තිලකරත්න

බලයලත් මිනින්දෝරු/ උසාවි කොමසාරිස්

ලි.ප. අංකය : 19831290

දු.ක. 071 2087971 / 081 2389803

06-246

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2019 වර්ෂය** | | | | | |
| **ජුනි** | 2019.06.07 | සිකුරාදා | 2019.05.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.14 | සිකුරාදා | 2019.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.21 | සිකුරාදා | 2019.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.28 | සිකුරාදා | 2019.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2019.07.05 | සිකුරාදා | 2019.06.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.07.12 | සිකුරාදා | 2019.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.07.19 | සිකුරාදා | 2019.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.07.26 | සිකුරාදා | 2019.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2019.08.02 | සිකුරාදා | 2019.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.09 | සිකුරාදා | 2019.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.16 | සිකුරාදා | 2019.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.23 | සිකුරාදා | 2019.08.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.30 | සිකුරාදා | 2019.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.